පහතින් අත්සන් කරන ශ්‍රී ලංකාවේ සමාජ ක්‍රියාධරයන් සහ සංවිධාන වන අපි, ඉකුත් කාලයේ සිදු වූ මානව හිමිකම් අපයෝජන සහ අන්තර්ජාතික මානුෂීය නීති කඩකිරීම් සම්බන්ධව සොයා බැලීමේ යෝජිත යුක්තිය පසිඳලීමේ ක්‍රියාදාම තුළ විදේශීය කාර්යමණ්ඩල සහභාගි කරවා ගැනීමේ හැකියාව, එක හෙළා ප්‍රතික්ෂේප කරමින් මෑත දී ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් සිදු කළ ප්‍රකාශ සම්බන්ධයෙන් බරපතල ලෙස සැලකිලිමත් වන්නෙමු. ඔහු ලංකාවේ දැනට පවතින අධිකරණ පද්ධතිය සහ විමර්ශන කරන ආයතන සම්බන්ධයෙන් සිය සම්පූර්ණ විශ්වාසය ද ප්‍රකාශයට පත් කළේ ය. මේ ප්‍රකාශ ශ්‍රී ලංකාව 2015 ඔක්තෝබර් මාසයේ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ (UNHRC) 30 වැනි සැසියේදී ශ්‍රී ලංකා රජයේ ද සම-අනුග්‍රාහකත්වය සහිතව සම්මත කරගත් ප්‍රඥප්තිය තුළ ඇතුළත් පොරොන්දුවලට පටහැනිය. එම ප්‍රඥප්තිය විසින් පොදු රාජ්‍ය මණ්ඩලීය සහ වෙනත් විදේශීය විනිසුරුවන්, අභිචෝදනාකරුවන්, නීතිඥයන් සහ විමර්ශකයන් ශ්‍රී ලාංකික අධිකරණ පද්ධතියක් තුළ සහභාගි කර ගැනීමේ වැදගත්කම ප්‍රකාශ කරන ලදී. ජනාධිපති සහ රජයේ වෙනත් පාර්ශ්ව විසින් මෑත සතිවල කරන ලද ප්‍රකාශ හරහා රජයට තමන්ගේ පොරොන්දු ඉටු කිරීමට අවංක දේශපාලන වුවමනාවක් පවතීද යන්න සම්බන්ධයෙන් ගැටළු පැන නගී.

පුළුල්ව පැතිරුණු දණ්ඩමුක්තිය සහ රාජ්‍ය කටයුතු අතර ගැටුමක් විධිමත් අපරාධ චර්යාවක් සම්බන්ධයෙන් පවතින විට, නඩු කටයුතුවල දී විදේශ කාර්ය මණ්ඩලවලශක්තිමත් සහභාගීත්වය රාජ්‍යය තුළ වින්දිතයන්ගේ විශ්වාසය ඇති කර ගැනීමේ ආරම්භක ස්ථානයක් ලෙසත් සහ ශ්‍රී ලංකාවේ සංක්‍රාන්ති යුක්ති ක්‍රියාදාමයන් තුළ සිටින සියලු කොටස්කරුවන්ගේ සහභාගීත්වය සහ විශ්වාසය තහවුරු කර ගැනීම සඳහාත් අවශ්‍ය වේ. ජනාධිපති සිරිසේන මහතා ඉදිරිපත් කළ අදහස් මේ සම්බන්ධයෙන් රජය විසින් වින්දිතයන්ට සහ අන්තර්ජාතික ප්‍රජාවට වූ පොරොන්දුවලට ඉතා තදබල ලෙස හානි කරයි. තවදුරටත් ඉකුත් කාලයේ රාජ්‍ය විමර්ශන කටයුතුවලදී විදේශික සේවා මණ්ඩල උපදේශකයන් සහ නිරීක්ෂකයන්, විදග්ධ පුද්ගලයන්ගේ අන්තර්ජාතික නිදහස් කණ්ඩායම (IIGEP) සහ අතුරුදන් වූ පුද්ගලයන් සම්බන්ධ ජනාධිපති කොමිසමේ උපදේශක කවුන්සිලය ආදියෙහි කටයුතු කර ඇත. එවැනි මූලාරම්භයන්හි අසාර්ථකත්වය නීතියේ ආධිපත්‍යයේ කඩා වැටීමට ද, දණ්ඩමුක්තියේ සංස්කෘතියකට ද, රජය ජනතාවට දුන් පොරොන්දුවලට අවංක වන්නේ නම් වහා අවධානය අවශ්‍ය වන වෙනත් ක්ෂේත්‍රවලට ද බලපානු ඇත. එසේම අන්තර්ජාතික මානව හිමිකම් සහ මානුෂීය නීතිය සම්බන්ධයෙන් වන බරපතල අපයෝජන ගැන විමර්ශනය කිරීමට සහ නඩු පැවරීමට

විශේෂඥතාවයන් සහ කුසලතා අවශ්‍ය වන බව අපි හඳුනා ගන්නා අතර, ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ පවතින්නේ රික්තයක් බව ද සටහන් කරන්නෙමු. එබැවින් රජය විසින් විදේශ කාර්ය මණ්ඩල දේශීය යන්ත්‍රණ තුළට ශක්තිමත්ව සහභාගි කරවා ගැනීම ඇතුළු කඩිනම් ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම තීරණාත්මක අවශ්‍යතාවක් වේ.

තවද ජනාධිපති විසින් ඉදිරිපත් කළ මේ අදහස් පැමිණෙන්නේ, රජය විසින් එක්සත් ජාතීන්ගේ සහයෝගය සහිතව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ (UNHRC) දී ඇති කර ගත් ප්‍රඥප්තියේ සඳහන් සංක්‍රාන්ති යුක්ති ක්‍රියාදාමයන් සැකසීමට උපදෙස් ලබා ගැනීමේ ක්‍රියාවලියක නිරතව සිටියදී ය. මෙම අදහස් විසින් එම ක්‍රියාදාමය තදබල ලෙස වෙනස් කරන අතර, එම සම්පූර්ණ ක්‍රියාදාමයේම අරමුණු සැකයකට බඳුන් කරයි. අපි රජයෙන් බල කර ඉල්ලා සිටින්නේ දුන් පොරොන්දු මුළුමනින් ම ඉටු කිරීමට වහා පියවර ගෙන, ශ්‍රී ලංකාව තුළ සත්‍යය, යුක්තිය සහ සංහිඳියාව ඇති කර ගැනීමේ ක්‍රියාදාමය සම්බන්ධයෙන් අවංකත්වය පෙන්නුම් කරන ලෙසයි.